# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colomo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com

## දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මාධ්‍ය නිවේදනය - අංක 01

### 2009- සැප්තැම්බර් 26

**පසුබිම**

දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදී CMEV ය විසින් මැතිවරණ නිරීක්‍ෂණ කටයුතු ආරම්භකර ඇත. ක්‍ෂේත්‍ර නිරීක්‍ෂකයන් 20ක් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් හම්බන්තොට දිස්ත්‍රික්කයට 4 ක් ද, මාතර දිස්ත්‍රික්කයට 7 ක්ද, ගාල්ල දිස්ත්‍රික්කයට 9 ක්ද, වශයෙන් යොදවා ඇත. ඔවුන් ඡන්ද විමසීමට අදාල පූර්ව ප්‍රචාරක සමය හා පශ්චාත් මැතිවරණ කාලය පිළිබඳව නිරීක්‍ෂණයේ යෙදෙනු ඇත. ඡන්ද විමසීම් දින දී විශේෂ නිරීක්‍ෂයන්ගෙන් සමන්විත ජංගම නිරීක්‍ෂණ කණ්ඩායම් 10 ක් යෙදවීමට සැලසුම්කර ඇත. තෝරාගත් සංවේදී ඡන්ද මධ්‍යස්ථානවල ස්ථාන නිරීක්‍ෂකයන් යෙදවීමට නියමිතය.

2009 අගෝස්තු 3 වන දින අංක 1613/1 දරණ ගැසට් නිවේදනය මගින් දකුණු පළාත් සභාව විසුරුවා හරින ලද අතර අංක 16131/39 දරණ ගැසට් පත්‍රයට අනුව නාම යෝජනා භාරගැනීම අගෝස්තු මස 21 සිට 28 දක්වා සිදුවීමත් සමගම ප්‍රචාරක කටයුතු ද ආරම්භ විය.

පිළිගත් දේශපාලන පක්‍ෂ හා ස්වාධීන කණ්ඩායම් 52 කට අයත් අපේක්‍ෂකයන් 1091 ක් දිස්ත්‍රික්ක තුනකින් දකුණු පළාත් සභා මැතිවරණය සඳහා තරග වදී. දකුණු පළාත් සභාව සඳහා තෝරාගැනීමට නියමිතව ඇත්තේ සාමාජිකයින් 55 දෙනෙක් පමණකි.

2009 සැප්තැම්බර් 17 දින සිට 19 දින දක්වා CMEV කණ්ඩායම, ඡන්ද විමසීමට අදාල දිස්ත්‍රික් තුනෙහි නිරීක්‍ෂණ චාරිකාවේ නිරත විය. මෙම එක් එක් දිස්ත්‍රික්වල එ.ජ.නි.ස, එ.ජා.ප හා ජ.වි.පෙ පක්‍ෂ කාර්යාල නිරීක්‍ෂණ කල අතර සම්බන්ධීකරණ නිලධාරින් හා දේශපාලන නායකයන් සමග සාකච්ඡා කරන ලදී.

සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා හා වෙනත් රාජ්‍ය නිලධාරින් සමග ද සිවිල් සමාජ ක්‍රියාකාරින් සමග ද මනා ලෙස මැතිවරණ නීති හා රෙගුලාසි ක්‍රියාවේ යෙදවීම සහතික කර ගැනිම පිළිබඳව වැඩිදුර සාකච්ඡා කරන ලදී.

**වත්මන් වාතාවරණය විශ්ලේෂණය කිරීම**

මැතිවරණට අදාල ප්‍රචණ්ඩක්‍රියාවන් සංඛ්‍යාවෙහි අඩුවක් දිස්ත්‍රික්ක තුනෙහිම දක්නට ලැබේ. විශේෂිත කාරණය වන්නේ එකම පක්‍ෂයේ කණ්ඩායම් අතර සිදුවන ප්‍රචණ්ඩක්‍රියාවන්ය. කෙසේ නමුත් පක්‍ෂය තුළ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සැලකිය යුතු ප්‍රමාණයක් එ.ජ.නි.ස අපේක්‍ෂයන් අතර සිදුවන අතර මැතිවරණ

ප්‍රචාරණ කටයුතුවලට රජයේ දේපළ භාවිතා කිරීමේ සිදුවීම් ද වාර්තා වේ. සියළුම දේශපාලන පක්ෂ පොලිසියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව යම් ආකාරයක සෑහීමකට පත් වී ඇතිබවක් ප්‍රකාශ කරන ලදී නමුත් ප්‍රචාරක දැන්වීම් හා අවසර නොලත් පක්ෂ කාර්යාල සම්බන්ධව පොලිසියේ ක්‍රියාකාරීත්වය පිලිබඳව විරුද්ධ පක්ෂ විසින් විවේචනය කරන ලදී.

බරපතල ලෙස සිදුවන මැතිවරණ නීති උල්ලංඝනයන් අතර පෝස්ටර් කටවුට් හා බැනර් භාවිතය ඉතා බහුලව සිදුවන අතර පාලන සංධානයේ අපේක්ෂකයන් මේ සඳහා ප්‍රධාන චෝදනා ලබන්නන් වේ.

මැතිවරණ නීති ක්‍රියාත්මක කිරීමේ දි පොලිසිය සිය වගකීම ඉටුකිරීමට අපොහොසත් වීමේ තත්වයන් ද දැකිය හැකිය. 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීමේ පනතේ 74 වගන්තිය මගින් ප්‍රසිද්ධ ස්ථානවල අත්පත්‍රිකා පෝස්ටර් දැන්වීම් ප්‍රදර්ශනයට එරෙහිව කටයුතු කිරීමේ බලය පොලිසියට පවරා ඇත.

පෝස්ටර් අත්පත්‍රිකා ප්‍රචාරක පුවරු ඉවත්කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පොලිසිය වෙත පහසුකම් සැපයිම සිදුකල යුතුය / පළාතේ සියළු ඡන්ද දායකයන්ට නිදහස් හා සාමකාමී ලෙස සිය ඡන්දය භාවිතා කිරීමට සුදුසු වාතාවරණයක් ඇතිකිරීම සඳහා සිය දකුණු පළාත් සභා මැතිවරණ ප්‍රචාරක කටයුතු වලදී මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවන් හා රාජ්‍ය දේපල අයථා පරිහරණය කිරීමෙන් වලකින ලෙස CMEV ය සියලුම දේශපාලන පක්ෂවලින් යලි යලිත් ඉල්ලා සිටියි.

පොදුදේපල අයථා පරිහරණය හා ඡන්දය භාවිතා කිරීමට ඇති බාධා අඩුකිරීමට අවශ්‍ය කටයුතු යෙදීම සහතික කරන ලෙස CMEV ය බලධාරින්ගෙන් ඉල්ලා සිටියි.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.

නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක